# නිර්මාණ Nirmana



## කලුතර බෝ සමිඳු

ගාලු පාරෙ කලුතර බෝ සමිඳුන් නේ
දකුණු පස තෙදැති සෑ රජු වැජඹෙන් නේ
දුටු විට සිතට මෙත් සිසිලස ගෙන එන් නේ
හද බැති පෙමින් මුදුනත් දී නමදින් නේ

පසෙකින් ගලයි කලුතර නදී කුම රිය
සවනට වැටේ සිලි සිලි බෝපත් ගීය
මෙත් සිත් වැඩී ගාථා මුව රැව් දේය
නිකෙලෙස් සිතුවිලිය එය හද සුව දේය

සැදැහැවතුන් දහසින් එති පුදන් නට
අහසට උසැති වෙහෙරෙහි සිරි නර ඹන්ට
සතුටින් සිත පිරේ මළුවෙහි සිටින විට
සිරිමා බෝධියෙහි සිසිලස දැනෙයි මට

කළුගං කොමළි බැස යයි ළඟ සිරි යාවේ
මෙත් සුව දේය කළුතර මහ බෝ මළුවේ
අටමහ බෝධියකි මෙහි බුදු රැස් විහිදේ
මහ සෑ රදුන්ගෙන් රටටම සෙත සැදේ

♦ **රත්නාවලි කුමාරි දිසානායක**
Hounslow Middx **UK**

## ආවර්ජනා

අරුණ උදයේ තුසර පින්නේ
දුරින් දුරකට තබා පියවර
යනෙන ඔබ දැක තනිව හිනැහුණ
පුංචි කුසුමයි මේ

සැඳෑ කල හුදකලා හෙවනක
තනිව හිඳ ඔබ සුසුම්ලන විට
හෙමින් දෝතට රැගෙන සිපගත්
සුළං රැල්ලයි මේ

සඳ මුදුන් වී තරු නිවී ගිය
කළුව ගිනිගෙන දැවුණු මොහොතක
මතක පොත මත ඔබ තබා ගිය
කඳුළු බිඳුවයි මේ

♦ **ශ්‍රියා කුමාරසිංහ**
**New Zealand**

## මතකය

පහන් රොදක් සේ ඔබ දැවටෙන සඳ
ගත මිහිරියි සුබ සිහින අවදිවන

මහෝඝයක් වී ගලා නොයනු ඔබ
මා හද අසපුව සෙනෙහෙ දියර ඉස

මුකුලිත කුසුමක පෙති විකසිත කොට
සුවඳ විඳින්නට හද ලෙන්ගතු කළ
ඔබමය මා වට සෙනෙහෙ පවුරු දම

♦ **රම්මි හෙට්ටිආරච්චි**
**London NW2**

## ශ්‍රීලංකා මහා බැංකුව

අහස්ගැබ අරා ඉන්ද්‍රඛීලයක් සේ
නැග හුන් මහා පහන් ටැඹ
දරා සිටියේ යැ සෝසුම්
සමග මැ මන හිනාවන්

දුන්නෝය වාහන ද, නිවහන්
මහමෙර උසට කහවණු
සෙනෙහස තිළින කළ ළඳ ඔබය
ඔබ රැක්කෙහිය අප නිරතුරු

කමන්න සොඳුර එනමුත්
ඔබ රැකගැන්මට
වීමු අපි අසමත්
ගුණෙන් ඇත සිටි සුදනන්

♦ **සඳුන් විජේසිරි**
*මිරිහාන නුගේගොඩ*
***Sri Lanka***

## බිම්බා බිසව් පුතු අමතයි !

මුදු පිය බසින් දෙසුමට තුම් දහම් සොඳ
බුදු බඳ කෙරෙන් ඉස ඉස මහ කැළුම් කඳ
මුදු පා තබ තබා යන අර කසුන් කඳ
අඳුනා ගන්න ඔබගේ පියතුමන් ලෙද

ඉපදුණු දිනේ ඔබ මා පෙම්බර පුතුනී
පොහොදින ඇසළ පුන්සඳ අහසේ දිලුණී
පියතුම ඔබෙ එදා තපසට ගිය බැවිනී
මුළු මාළිගාවම දුක් අඳුරේ ගිලුණී

මුත්තණුවන් ද ඔබගේ මිත්තණී සම ගින්
සත් වසරක්ම පියතුම ගැන සිහිකර මින්
මොළකැටි ඔබ තුරුළු කරගෙන දැවෙන හදින්
මා ගෙවි දිවිය අද මට සිහිවේ නිතැ තින්

අප ගැන මෙන්ම මුළු ලෝ සතහට කුළු ණින්
ගොඩගනු පිණිස දුකඳුරු පිරි බව සයු රින්
සම්බුදු පදවි ලැබගෙන සැනසී නිව නින්
මෙහි වැඩිසේක අප හැම දෙන කෙරෙහි මෙතින්

ඔබ වෙයි ඒ පියාණන්ගේ එකම පුතු
උරුමයි ඔබට සම්පත් පියතුමන් සතු
මහ මහ වඩී එතුමා සනහමින් නෙතු
ඔබ එහි ගොසින් ඒ ගැන දැන් ඇසිය යුතු

♦ *විශ්‍රාම ලත් විදුහල්පතිනි*
**ප්‍රේමා අදිකාරි**
**Morden Surrey UK**

## අප්පච්චිට ගතුවක්

මහා ලොකු දෙයක් මෙන් උයනපොත් බල බලා
සති අන්තයේ අම්මා කුස්සියේ රජ කළා
උදව්වට ගියා මං අම්මා ගැන දුක්වෙලා
දන්නවද අප්පච්චි එයා මට සැර කළා

හාල් ඇට විසිරුණේ ගරන්නට ගිහිල්ලයි
වතුර ටික ඉහිරුණේ කෝප්පෙට වැඩිවෙලයි
උදව්කරනා විටදි ඔහොම වෙනවා තමයි
අම්මාට මේව තේරෙන්නෙ නැත්තේ කිමැයි?

බහිනවද හොඳ හිතින් මේසයෙන් කිය කියා
අම්ම මගෙ පස්සෙමයි මගෙ වැරදි සොයසොයා
මදැයි මං උදව්වට වැඩකරන්නට ගියා
ඉස්තුතී කරන්නට දන්නෙ නම් නෑ එයා

♦ **ශ්‍රීපාලි කොටුවැල්ල CA, USA**

## සෙනෙහසක හැටි

සුසුදු සුමුදු පෙණ බුබුලක වෙස් ගෙන
සැඩ පහරක් විය දිවිය මුලා කළ
ගිමන නිවන මඳ පවනක වෙස් ගෙන
කුණාටුවක් විය දිවිය අවුල් කළ

සිනිඳු සුමට මල් පෙත්තක වෙස් ගෙන
විස කටුවක් විට නිබඳ රිදුම් දෙන
කුසලානෙක මී විතක වෙසක් ගෙන
විසෙකි හලා හල දිවිය අවුල් කළ

පුළුන් රොදක බඳු සැහැල්ලු වෙස්ගෙන
මහා මෙරක් විය සිත යට සැඟවුණ
සීත සමේ උණුසුමක වෙසක් ගෙන
මහ ගින්නක් විය දිවිය දවා හල

♦ **මධුරි රත්නායක**
Ilford, Essex **UK**

## බිඳුණු ප්‍රේමය

කතාවක් නෑ මට ඔබත් සමගින්
වතාවක් දුක් දුන්නු වරදෙන්
සිනාවක් වත් වෙන්න තහනම්
වරක් නොව දහස් වාරයක්

සිනාවෙන් කළ වසඟ මා සිත
කතාවෙන් පෙම් බැන්ද මතකයි
පතා වෙන්වී ගියෙන් දුරකට
සමාවෙන් දැන් කියනු කුමකට

ආවා ගියා මෙරුන් දැල්ලට
පාවා දුන් ඔබ තවත් හදකට
ගාවා දැලි මුහුණ වසන් කොට
නාව එක ඔබ හොඳක් විය මට

තාම මතකයි කටුක අතීතය
කෝම මකා දමන්නද එය
බෝම ලෙන්ගතුකමින් අද ඔබ
ප්‍රේම කරයි ළංව තවත් හදකට

**ධම්මිකා තෙන්නකෝන්**
**Nicosia Cyprus**

*ලොව පුරා විසිරී සිටින අප පාඨක හිතවතුන් වෙතටයි. කවිය තරම් සුන්දර දෙයක් තවත් නැත. ඔබේ කාව්‍යමය සිතැඟි අප වෙත එවන්න.*
*ඔබට ජයවේවා ! - කර්තෘ*

## මගේ පණ නල

ඔබේ සෙනෙහස
විඳින්නට මම
සසරෙ පෙර
පින් කළ නිසා
කෙසේ හෝ ඔබ
සොයා එන්නෙමි
දෛවයෙන් මග
තොට අසා

ඔබ මලක් කොට
මහද පුදසුන
තබන්නෙමි
සොරගුළු වසා
සිතට ඔබ හැර
යන්න නොම දෙමි
ඔබ මගේ
පණ නල නිසා

♦ **නිරංජලා**
**මනෝහාරි**
Nicosia **Cyprus**

## නොමියෙන තිළිනය

උපන් දින දා උදෑසන
නන් දෙසින් ආ සුහද පැතුමන්
හදට තුරුළුව හිතට පණ ලද
මොහොතේදී මට ඔබව සිහිවිය

සුබ පතා හැම උපන්දිනයෙම
අමතනා ඔබෙ කුළුණු කට හඬ
නොමැත දැන් මට තිළින වන්නට
හද දවයි ඔබ නොමැති බව දැන

හිතේ පිරි දුක තුරුළු කරගෙන
ඔබේබ් සැමරුම් අත හිරවී
වට පිටේ ඇති පෙරදි ඔබ දුන්
තිළින අතරට නෙත් යැවූ සඳ

එක්තරා තව උපන්දිනයක
අතීතයෙ ඔබ මට තිළින කළ
රෝස පඳුරේ පිපි සුවඳ මල
උපන් දින අද සුබපැතුම් ගෙන
අසිරියක් ලෙස පිපී බැබළෙයි

සදා නෙමියන තිළිනයකි එය
ඔබේ රුව මා හදේ මතු කළ

♦ **මධුරි අබේවික්‍රම**
**Harrow UK**

## රසවිඳගන්නට නිති වැඩිහිටියෝ මෙසේ පවසති

වපුරණ තරමටයි අස්වනු ලැබෙන්නේ
පින්නෙන් නොවේ වැස්සෙනි වැව් පිරෙන්නේ
වැල යන අතටමයි මැස්සත් බැඳෙන්නේ
ඌරන් ඉදිරියේ නැත මුතු දමන්නේ

කණකොක් සුද පෙනෙන්නේ ඉගිලුණ විටලූ
දෙවරුවෙ දකින කුකුළගෙ කරමල සුදුලූ
හිටියත් යක් දරුවො යක් මව්පියො නැහැලූ
පණ්ඩිතයාට ඒදණ්ඩෙත් යනු බැහැලූ

වැල මියැදෙන්නෙ ටික ටික අල බහින විට
වඳුරා බිම නොයයි පැන්නත් වයස හැට
තැල්ලක් මක්කටද බෙල්ලක් නොමැති කොට
කා මිස දී හඬක් නැත කිසි කපුටෙ කුට

කජු පුහුලමට වවුලන් වහවැටෙන් නේ
මගුලත් උගුලක්ය අදටත් ඇහෙන් නේ
ගිලීමලෙත් දත සුද්දන් සිටින් නේ
සමහරු බතල හිටවන්නේ කටින් නේ

කිරි දොවනටද ඇත්තේ වැස්සියගෙ අහත්
අමුඩය ගසයි හත් ගව්වක් දුරදි ගහත්
වෙස්බැන්දාට සැඟවී එළිපිටදි රහත්
බුදුපුත්වරු දෙසති දුක්දුරුකරන මගත්

බත් ටික බුදින්නේ කුසගිනි නිවෙන් නටයි
මසු ඇම ගිලින්නේ එසැනින් නහින් නටයි
හෙණහඬ කළු වළා එන්නේ වහින් නටයි
අට පහ නොරැක ඉන්නේ දුක් විඳින් නටයි


**ගම්පහ පිලික්ස් ඩී. ප්‍රනාන්දු**
යක්කල **Sri Lanka**

## ප්‍රථම ප්‍රේමය

**පොල් අතු රටාවට**
**සිරුවෙන් අතුගාන**
**මිදුල පුරාවට හැමදාම**
**ඉදුණු කොළ අහුරක්**
**විසුරුවන දඟකාර සුළඟ**

**නුඹත් හරියට**
**සිතක් හැඩිකළ**
**පළමු පෙම වගේමයි**

♦ **වසන්තා කුමාරි**
**දසනායක**
**කිරිදිවැල**
**Sri Lanka**



## අවබෝධය

කල්ප ගණන් මේ ඉර හඳ සෙවනේ
පෙරුම් පිරූ නිල් දෑස සොයා
පාර අසාගෙන ආවෙමි දුර සිට
සසරේ සුපුරුදු සිසිල පතා

දිවි මං තලයේ පිබිදුණ මල් පෙති
ආදරයෙන් පුදසුනක තබා
ලොවකට රහසින් බලා හිඳින්නද
ඔබෙ පාමුල මා සිරස හොවා

නෙතු යුග අයදින නුරා පහස මිස
නොලදිමි ඔබගෙන් රැකවරණේ
මගෙ සෙනෙහස තව පිවිතුරු හින්දයි
මේ තරමට මගෙ හිත රිදුනේ

අනුරා කැල්මෙන් මා සතපන්නට
එපා තවත් ඒ සුව සහනේ
සමුගෙන යන්නට ඉතින් අවසරයි
ආදරයෙනි මගෙ හිත පිරුණේ

♦ **සන්ධ්‍යානි සේනාරත්න**
Rohampton, **London SW15**

## ප්‍රභා......

**කසුන් වතෙහි තවරා මුදු සිනා පැහැ රිදී**
**සුරත් කොපුල් පිපී - ලවන් සෙමෙන් හැපී**
**මුදු කැළුම් මැවී මැවී**
**ප්‍රභාවන්ති පිය මනීව් ලැසි සෙයින් හදේ**

**මල් පෙතී සියුම් නැතී**
**ආදරේ සුසුම් බිඳක් වගේ ඉතා සියුම්**
**ජීවිතේම පාවයයි පුළුන් රොදක් වෙමින්**
**ප්‍රභාවන්ත ඔය නෙතින් ලෝකයම දකිම්**

**ආත්මය වෙනස් වෙලා නිමේශයක් තරම්**
**කල්පයක්ය ආදරේ ඉනුත් නැතේ නිමක්**
**පුදා හිඳින් තවත් මලක් ලිහා දෙතොල් සිහින්**
**ප්‍රභාවන්තියේ නුඹයි මගේ මෙ හැම සුසුම්!**

♦ **මහින්ද ප්‍රසාද් මස්ඉඹුල**
ගොඩකවෙල
**Sri Lanka**





## ජංගම දුරකතනයෙන් වන විනාසේ

හස රැල්ලෙන් පැෂන් එක දී මිතු රන්ට
අස මත්වෙමින් ඉගනීමට හිත දෙන්ට
හිස එක එක අතට යන රස විඳ ගන්ට
විස බීජයකි මෙය පාසැල් සිසු වන්ට

පවු ලෙන් පවුල සිසීකඩ හොඳට හිටී
අවු ලයි රටේ ගිනිගෙඩි හැම තැනම කොටී
යව් වන ලොවම ඇත එක එක මගට වැටී
මව් පියවරුත් දරුවන් ගැන හිතනු වටී

කාන් දමට යකඩය පැටලුනා සේ
සේන් දුවෙන ලෝකෙම සතු වුනාසේ
හැන් පෝනයෙන් වන මෙම විනාසේ
පේන් නට තිබේ කාටත් මනාසේ

♦ **කිව්පති පාතකඩ කුලතිලක**
මහරගම **Sri Lanka**

## මනමාල ගිරා

කරනම් ගසා අහසින් අඹ ගහට නැග
දළු කොළ කඩා තුඩගින් ඇන කරන දඟ
රැකවල් කරන් හිටියත් යන අතර මග
නුඹ දන්නවා මා අන්සතු ළඳක වග

ඔහු මේ කැදැල්ලට මා අරගෙන ආවේ
ගිය පෝ දිනයි මොර සූරන වරු සාවේ
මට ඔහු තමා ඔහුටද ඇති සැප මාවේ
අප එක් සිතින් මයි එක සෙවනට වූවේ

අඩවන් නෙතින් බැල්මෙන් ඉගි කරන විදී
මගෙ හිත නමාගන්නට දැරූ වෙහෙස මදී
යන එක හොඳයි කුදලාගෙන දගර පොදී
ඔහු ආවොතින් නුඹෙ අත්තටු දෙකම සිදී

ගැයුවත් නුරා ගී කියමින් නෙක තාල
බැලුවත් හොරෙන් අඩ බැල්මෙන් මන මාල
රැඟුවත් කොතෙක් රැගුමන් කරමින් ලීල
මමවත් මගේ හදවත නැත ඔට ලෝල

තටු විහිදුවා අත්තෙන් අත්තකට ගිහින්
මගෙ ගෙට එබෙන්නේ දල්වා දෙනෙත සිහින්
කොන්කර දමයි නුඹ දවසක නුඹගෙ රැහින්
අන්සතු ළඳක් දෙස නොබලන් වපර ඇහින්

හොට ලස්සනයි කර මාලය රතට රතයි
ගත ලස්සනයි දිලිසෙන කොළ පැහැය ඇතැයි
ගති ලස්සනයි නැත්තේ හැම දෙනම හිතයි
අවලස්සනයි නුඹෙ හැම සිතිවිලිද කැතයි

පලවැල අරන් එන හිමි දැන් ළඟම ඇතී
පල නැත කොතෙක් හිටියත් වටපිටම එතී
පලවාහරින්නට පෙර හිත සැකය හිතී
පලයන් මාල ගිරවෝ හුරතලය ඇතී

පරඬැල් සොයා ගෙනගොස් සෙවනැති තැනක
හැඳුවත් කැදැල්ලක් තුරු මුදුණේ බෙනක
සිත සන්තොසින් ඉන්නට නුඹටත් දිනක
හමුවෙයි කුරුලු කෙල්ලක් පැහැබර කණක

♦ **රත්නා ලංකා අබේවික්‍රම**
බත්තරමුල්ල **Sri Lanka**